**මගේ අංකය: ජෙඑස්සි/ඊඒ/ස්ථානමාරු -2018**

**සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්, සිවිල් අභියාචනා මහාධිකරණ විනිශ්චයකරවරුන්,**

**දිසා විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන්,**

**ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,**

**<u>උපලේඛණගත රජයේ නිලධරයන්ගේ/ වැඩ සටහන් සහකාර (අධිකරණ) ගිණුම් සහකාර,</u>**

**<u>සංවර්ධන නිලධරයන්ගේ වාර්ෂික ස්ථානමාරු -2018</u>**

යථෝක්ත කරුණ සම්බන්ධයෙන් මගේ 1995.07.03 දිනැති අංක 206 හා 1997.07.03 දිනැති අංක 206 (I) දරණ චක්‍රලේඛ ප්‍රකාරව 2018 වර්ෂය සඳහා වූ ස්ථානමාරු අයදුම්පත් මේ සමග එවා ඇති "අ" ආකෘතිය අනුව සකස් කොට ඉදිරිපත් කරන ලෙස 2017.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර හතරක් (4 ක්) හෝ ඊට වැඩි කාලයක් සම්පූර්ණ කොට ඇති ඔබ අධිකරණයේ සේවයේ නියුතු සියලුම උපලේඛණ ගත රජයේ නිලධරයන්ට සහ වැඩසටහන් සහකාර (අධිකරණ ) ගිණුම් සහකාර, සංවර්ධන නිලධරයන්ට දැනුම් දෙන්න.

02. අදාල සියලුම නිලධරයන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සියල්ල එක් ආවරණ ලිපියක් මගින් **<u>2017.06.30</u>** දින හෝ එදිනට පෙර මෙම කාර්යාලයට ලැබෙන්නට සලස්වන්න. ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ වම් ඉහල කෙලවර "**<u>පිරිස් පාලන ශාඛාව</u>**" වශයෙන් සඳහන් කරන්න.

03. තවද, ඉහත පළවන ජේදයේ සඳහන් පරිදි වර්ෂ හතරක් (4 ක්) හෝ ඊට වැඩි කාලයක් සම්පූර්ණ කරන නමුත් ස්ථාන මාරු අයදුම්පත්‍ර ඉදිරිපත් කරනු නොලබන නිලධරයන් සේවා අවශ්‍යතා මත පුරප්පාඩු පවත්නා අධිකරණවලට ස්ථාන මාරු කරනු ලැබීමට යටත් වන අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා නොලැබීමට ද අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

04. මාරු වීම් ඉල්ලා සිටීමේ දී නිලධරයන් විසින් තම කැමැත්ත අනුව (අයදුම් පතේ අංක 10) අනිවාර්යයෙන්ම ස්ථාන තුනක්(3 ක්) නම් කල යුතු අතර, එකම අධිකරණ සංකීර්ණය තුල පිහිටි අධිකරණයන් වෙන් වෙන් ස්ථාන වශයෙන් නම් **<u>නොකල යුතුය</u>**. එසේම වර්තමාන සේවා ස්ථානය පිහිටි අධිකරණ සංකීර්ණයේ වෙනත් අධිකරණයක් ද නම් නොකල යුතුය. **(එක් අධිකරණ සංකීර්ණයක් තුල පිහිටි සියලු අධිකරණ ස්ථාන මාරු කාර්යය සඳහා එක් ස්ථානයක් ලෙස සලකනු ලැබේ.)**

**<u>අයදුම් කලයුතු ආකාරය පිළිබඳ උදාහරණ -</u>**

<u>මාතර දිසා අධිකරණයේ සේවයේ නියුතු නිලධරයකුගේ තේරීම්</u> :

1. තංගල්ල දිසා අධිකරණය
2. ගාල්ල මහාධිකරණය
3. දෙයියන්දර මහේස්ත්‍රාත් අධිකරණය

<u>තෙල්දෙණිය දිසා අධිකරණයේ සේවයේ නියුතු නිලධරයකුගේ තේරීම්</u> :

1. මහනුවර අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්
2. ගම්පොල දිසා අධිකරණය
3. මාතලේ දිසා අධිකරණය

05. කිසිම නිලධාරියෙකු තම කාලත්‍රයා දැනට අධිකරණ සේවයේ නියුතුව සිටී නම් එම අධිකරණයටම ස්ථාන මාරුවීම් ඉල්ලා නොසිටිය යුතුය.

06. මෙම උපදෙස්වලට පටහැනිව අයදුම් කරන නිලධරයන් හට ඔවුන් විසින් ඉල්ලා ඇති සේවා ස්ථාන ලබාදීමට නොහැකි වන අවස්ථාවන් හි සේවා අවශ්‍යතාවයන් මත අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සේවා ස්ථාන ලබා දෙනු ඇත.

07. **<u>ස්ථාන මාරු ලබාදීමේ පිළිවෙල.</u>**

ස්ථාන මාරු ලබාදීමේ දි අධිකරණ සේවා කොමිෂන් සභාව හැකිතරම් දුරට ඉල්ලා ඇති පළමු මනාපය ලබාදීමට උත්සාහ දරනු ඇත. නමුත් සියලුම නිලධාරීන්ගේ ඉල්ලීම්වලට සාධාරණ ඉඩක් ලබාදීම සදහා ස්ථාන මාරු සිදු කල යුතු බැවින් සමහර අවස්ථාවල දෙවන හෝ තුන්වන මනාප ස්ථාන ලබාදීමට සිදු වනු ඇත.

08. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් බාර ගනු නොලැබේ.

09. 2017.12.31 දිනට ඔබ අධිකරණයේ වසර 04 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්ගේ නාම ලේඛණයක්ද ස්ථාන මාරු අයදුම්පත් සමඟ එවන මෙන් වැඩි දුරටත් දන්වමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පී.එම්.ටී. බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

අත් කලේ/ පී.එම්.ඩබ්.පී.ජයතිලක
වැඩබලන ලේකම්,
අධිකරණ සේවා කෙමිෂන් සභාව

2017 මැයි මස 31 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දි ය.

## උපලේඛණගත රජයේ නිලධරයන්ගේ / වැඩසටහන් සහකාර (අධිකරණ) ගිණුම් සහකාර, සංවර්ධන නිලධරයන්ගේ වාර්ෂික ස්ථානමාරු - 2018

| සේවාව - |
|---|

1. නිලධාරියාගේ සම්පූර්ණ නම -:

මහතා/මහත්මිය/මෙනවිය

2. මුලකුරු සමඟ නම -:

3 2017.12.31 දිනට වයස අවු මාස දින

4. ස්ත්‍රී/පුරුෂ භාවය-:

5. විවාහක/ අවිවාහක බව -:

6 තනතුර -: ශ්‍රේණිය -:

(ලඝු ලේඛක, යතුරු ලේඛක හෝ භාෂණ පරිවර්තක නිලධරියෙක නම් මාධ්‍ය සඳහන් කරන්න)

7. දැනට සේවය කරන අධිකරණය-:

8. ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය-:

ඊට ආසන්නතම නගරය-:

9. මුල් පත්වීම ලද දින සිට සේවය කල සේවා ස්ථාන හා සේවා කාලයන් අනුපිළිවෙලින්

| අනු අංකය | සේවා ස්ථානය | සේවා කාලය | |
|---|---|---|---|
| | | ............ දින සිට | ............... දින දක්වා |
| | | | |

10. මාරුවීම ඉල්ලා සිටින ස්ථාන 03 ක් කැමැත්තේ අනු පිළිවෙලින් දක්වා ඒ ඉදිරියෙන් එම ස්ථානයන්හි කලින් සේවය කර ඇති කාල සීමාවන් ඇත්නම් සඳහන් කරන්න. (ස්ථාන 03 ක් අනිවාර්යෙන්ම නම් කළ යුතුය)

| අනු අංකය | ඉල්ලා සිටින ස්ථාන | සේවය කර ඇති කාලයන් (ඇත්නම්) | | පදිංචි ස්ථානයේ සිට ඇති දුර | පදිංචි සථානයේ සිට කෙටිම මාර්ගයෙන් ලගා වීමට ගත වන කාලය | කාලත්‍රයා අධිකරණ සංකීර්ණයේ සේවය කරන්නේද ? එසෙ නම් කුමන අධිකරණයකද? |
|---|---|---|---|---|---|---|
| | | ................දින සිට | ...............දින දක්වා | | | |
| 01 | | | | | | |
| 02 | | | | | | |
| 03 | | | | | | |

11. මාරුවීම ඉල්ලා සිටින ස්ථානයේ අධිකරණයක ඔබ හෝ ඔබේ පවුලේ කෙනෙකු හෝ සම්බන්ධ නීති කෘත්‍යයක් තිබේද? එසේ නම් එහි ස්වභාවය, පාර්ශවකරුවෙක්ද, සාක්ෂිකරුවෙක්ද යන වග හා එය පවතින අධිකරණය-:

12. කලත්‍රයාගේ රැකියාව හා රැකියා ස්ථානය -:

13. දරුවන් සිටී නම් ඔවුන්ගේ නම් වයස හා අදාල වන්නේ නම් අධ්‍යාපනය ලබන පාසල්

| නම | වයස | පාසල | විශේෂිත කරුණු |
|---|---|---|---|
| | | | |

14. ස්ථානමාරු ඉල්ලීම් සම්බන්ධ වෙනත් සඳහන් කල යුතු බවට ඔබ අදහස් කරන කරුණු ඇත්නම් කෙටියෙන් සඳහන් කරන්න.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් මෙයින් සහතික කරමි. මා විසින් ඉදිරිපත් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව හෙළිදරව් වුවහොත් මා විනයානුකූල දඬුවමකට යටත් වන බවද දනිමි.

දිනය....................................

...................................

නිලධරයාගේ අත්සන

ප්‍රධාන රෙජිස්ට්‍රාර්වරයාගේ/වරියගේ නිර්දේශය

නිලධාරියා විසින් අයදුම්පතෙහි ඉදිරිපත් කර ඇති කරුණු මා විසින් පෞද්ගලිකවම ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව පරීක්ෂා කර නිවැරදිව බව තහවුරු කර ගන්නා ලදී.

ඊට අමතරව පහත කරුණුද ගරු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානයට යොමු කල යුතු බව ගෞරවයෙන් යෝජනා කරමි. (නිලධාරයාගේ දක්ෂතා / දුර්වලතා / සේවයට සුදුසු ගුණාංග/විශේෂ අපහසුතා / විනය කටයුතු පවතිද යනාදිය)

1.

2.

දිනය...............................                                        .....................................

ප්‍රධාන රෙජිස්ට්‍රාර් ගේ අත්සන හා

නිල මුද්‍රාව

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

ඉහත ප්‍රධාන රෙජිස්ට්‍රාර්වරයා/ වරිය ඉදිරිපත් කර ඇති කරුණු සහ පහත කරුණු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානයට ලක් කර අනුප්‍රාප්තිකයෙකු සහිතව/ රහිතව නිලධරයාගේ ඉලලීම නිර්දේශ කරමි/ නොකරමි.

දිනය ......................................                                        ...................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව තබන්න)

**My No. :- JSC/EA/Transfers – 2018**

**To all High Court Judges, Civil Appellate High Court Judges,**
**District Judges, Magistrates,**
**Registrar of the Supreme Court and Registrar of the Court of Appeal.**

**Annual Transfers – 2018**

**Scheduled Public Officers/ Programme Assistants(Judicial)**

**Accounts Assistants/Development Officers**

Applications are hereby called from Scheduled Public Officers and Programme Assistants (Judicial) Accounts Assistants/Development Officers serving in your court for a period of four (04) years or more as at 31.12.2017 for annual transfers 2018 in the specimen form "A", as per J.S.C. Circular No. 206 dated 03.07.1995 and No. 206 (1) dated 03.07.1997.

02. All applications from your Court should be forwarded under one covering letter to reach the Judicial Service Commission Secretariat on or before **30.06.2017** Please mention "Human Resource Management Branch" on the upper left corner of the envelope.

03. Further, the Judicial Service Commission has decided to transfer officers who do not forward transfer applications having completed four years or more as set out in the first paragraph, to courts where vacancies exist depending on exigencies of service and appeals against such transfers will not be considered.

04. Officers are required essentially to mention 03 stations of their order of preference. Courts in the same complex should not be named separately and also a court in the same complex where the officer is currently serving should not be named. **( A Court Complex is considered as a single station for the purpose of transfers.)**

Eg.

| Preferences of an officer serving in District Court Matara | Preferences of an officer serving in District Court Teldeniya: |
|---|---|
| 1. District Court Tangalle | 1. A Court in Kandy Courts Complex |
| 2. High Court Galle | 2. District Court Gampola |
| 3. Magistrate Court Daiyandara | 3. District Court Matale |

05. In the event of failure to adhere to these instructions ,by officers the JSC will allocate stations on exigencies of services, notwithstanding the officers preferences.

06. No officer should prefer a station where his or her spouse is working.

07. Procedure of Posting

i. The JSC will try to accommodate each officers' first preference, although there may be instances where the JSC would have to resort to second or third preference in order or provide a suitable station to all officers.

08. Late applications will not be accepted.

09. You are father informed to send a list of names of the officers who have completed a service period of 04 years at 31.12.2017 in your Court along with the transfer application

For Secretary
Judicial Service Commission

P.M.T. BANDARA
Senior Assistant Secretary
Judicial Service Commission
Colombo 12.

G.M.W.P. Jayathilake
Acting Secretary
Judicial Service Commission
Sgd/-

31 May 2017
Judicial Service Commission Secretariat,
Colombo 12.

Specimen Annual Transfer Application Form - 2018

Scheduled Public Officers / Programme Assistants (Judicial)

Accounts Assistants/Development Officers

Service -

1. Name in full:

Mr/Mrs/Miss

2. Name with initials:

3. Age as at 31.12.2017 , Years Months Days

4. Gender: Male/Female

5. Marital Status :

6. Designation: Grade :

(In case of a Stenographer, Typist or an Interpreter the medium should be stated)

7. Present Station:

8. Permanent Address:

Nearest Town:

9. Previous stations with periods from the date of first appointment. (in sequence.)

| No. | Service Station | Service Period | |
|---|---|---|---|
| | | From | To |
| | | | |

**10.** Three (03) Stations in order of preference, ( in case of having previously served at any of the said stations with the period of service in such stations.) **<u>(It is mandatory to name 03 stations)</u>**

| No | Station | Service period (if any) | | Distance from Residence | Required time to reach from Residence | Court in when the spouse working (if applicable) |
|---|---|---|---|---|---|---|
| | | From | To | | | |
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |

11. Is there any legal proceeding relating to you or a member of your family pending at the station of your choice ? If so state its nature and whether you or the person in question is a party or a witness in such proceedings and the name of the court where the matter is pending.

12. Occupation and Institutions of the spouse ( if working).

13. The names, ages and schools (if applicable) of your children, if any

| Name | Age | School | Remarks |
|---|---|---|---|
| | | | |

14. State briefly of any other matters you wish to state with regard to your transfer application, if any

I certify that the particulars furnished above are true and accurate. I have the full knowledge that I would be dealt accordingly if any fact stated in this application is to be found false.

.................................... .......................................

Date Signature of the officer

**Certificate of the Registrar**

I certify that I have verified personally the details contained herein with the personal file of the officer.

Further I submit that following matters should be drawn to the consideration of the JSC (Officers merits/demerits/special disabilities).

1.

2.

...................................... ..................................................................

Date Signature of Registrar and the official Stamp

Certificate of Head of the Department

I wish to draw the following facts to the consideration of JSC along with other facts stated by Registrar. The above officer's request is recommended/ not recommended, with/ without a replacement

...................................... .....................................................................................

Date Signature of the Head of the Department and Official Stamp